පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
08

# තෙවන වාර පරීක්ෂණය - 2023

## නර්තනය

පාසලේ නම : .............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2 ½ යි

## නර්තනය - I

- **<u>එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ප්‍රශ්න 20 සඳහා ලකුණු 40 යි.</u>**
- **<u>ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.</u>**

1. “ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ.....” මෙම ගායනය

   (i) සවරන් කවියකි (ii) පතුරු කවියකි. (iii) සිරසපාද කවියකි. (iv) සෙත් ශාන්ති කවියකි.

2. ධනයට හා සමෘද්ධියට අධිපති දේවිය ලෙස හින්දූන් විසින් සලකනු ලබන්නේ

   (i) සරස්වතී දේවිය (ii) දුර්ගා දේවිය (iii) ලක්ෂ්මී දේවිය (iv) පත්තිනි දේවිය

3. ඓතිහාසික තොරතුරු අනුව දළදා පෙරහැර මුල් වරට පවත්වන ලද්දේ

   (i) මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේදී ය. (ii) දුටු ගැමුණු රජතුමාගේ කාලයේදී ය.

   (iii) කීර්ති මේඝවර්ණ රජුගේ කාලයේදී ය. (iv) IV වන පරාක්‍රමබාහු රජුගේ කාලයේදී ය.

4. බෙල්ල, උරහිස, වැලමිට, දණහිස ආදී ශරීරාංග කොටස් අයත් වන්නේ

   (i) අංග (ii) ප්‍රත්‍යංග (iii) උපාංග (iv) සර්වාංග

5. “දීකිරි දීකිරි ගෙනාවා දීකිරි.....” ගීතයේ පද රචනය කරන ලද්දේ

   (i) ඔස්ටින් මුණසිංහ මහතා (ii) අනුලා බුලත්සිංහල මහත්මිය

   (iii) ලූෂන් බුලත්සිංහල මහතා (iv) මහගම සේකර මහතා

- **<u>ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුර හිස්තැන මත ලියන්න.</u>**

6. රසයක් උපදින්නේ ............................................. මුල් කොට ගනිමිනි.
7. භරත නාට්‍යම්හි සංගීත කණ්ඩායමේ “නටුවංගම්” වාදනය කරනු ලබන්නේ ...................................... විසිනි.
8. ගොයම් කැපීමේ නැටුම, නාරිලතා නැටුම...................................... විසින් නිර්මාණය කරන ලද නර්තන නිර්මාණ වේ.
9. ප්‍රථම වරට දෙවොල් මඩු ශාන්තිකර්මයක් සිදු කරන ලද්දේ ...................................... දීය.
10. සිරසේ සිට පාදාන්තය දක්වා සියලු දෝෂ දුරු කර ගැනීම සඳහා ශාන්තිකර්ම වල දී ....................................................... කවි ගායනා කරනු ලැබේ.

❖ **<u>ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.</u>**

11. "තක් තකට තක රොං........" මෙම පද කොටස අයත්වන්නේ කුමන වන්නමකට ද?..................................

12. "අවුල් හැරය, ශිඛාබන්ධනය, හඟල" යනාදී කොටස් අයත්වන අඳුම් කට්ටලයේ නම ලියා දක්වන්න. ............

13. ඉරුගල් බණ්ඩාර, වීරමුණ්ඩ දෙවි, කඩවර යකුන් පුදලබන ශාන්තිකර්මය ලියන්න....................................

14. උඩරට පා සරඹ හමාර කිරීමේ පදය ලියන්න.....................................................................

15. වෛරොඩි වන්නම නර්තනය කරනු ලබන තාල රූපය කුමක්ද?.....................................................

❖ **<u>ප්‍රශ්න අංක 16-20 දක්වා ප්‍රශ්න සඳහා හරිනම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.</u>**

16. වන්නම්වල තානම මගින් ගායන නාද මාලාව හඳුනාගත හැකි අතර වන්නමේ කවිය මගින් වන්නමේ ප්‍රස්තුතය විස්තර වේ. (.........)

17. "රත්නදීප ජන්ම භූමී" යන ගීතයේ පද රචනය කරන ලද්දේ මහගම සේකර විසිනි. (.........)

18. මාත්‍රා තුනේ තාලය විභාග 4කට වෙන්කර දැක්වීමේ දී එයට හිමි මුළු මාත්‍රා සංඛ්‍යාව 6 කි (.........)

19. දාසි අට්ටම් නමින් හැඳින් වූ නර්තන සම්ප්‍රදාය භරත නාට්‍යම් ලෙස නම්කරන ලද්දේ මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි විසිනි. (.........)

20. නර්තනයෙහි ගායනයෙහි හා වාදනයෙහි සුවිශේෂ දක්ෂතා දැක් වූ ඩී.වී හින්නිලමේ ගුරුතුමා උඩරට නර්තන ශිල්පියෙකි. (.........)

## II කොටස

- ❖ එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05 සඳහා ලකුණු 60කි .
- ❖ පහත සඳහන් ප්‍රශ්න අතරින් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

1. I. 7 වන පා සරඹ පදය ලියන්න. (ල.02)

   II. දෑල සරඹයට අයත් කස්තිරම ලියන්න. (ල.04)

   III. 6 වන ගොඩසරඹ පදය මාත්‍රා හතරේ රූපයට අනුව ලය තුනට ප්‍රස්තාර කරන්න. (ල.06)

2. I. දේශිය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු දැක්වෙන මුලාශ්‍ර දෙකක් ලියන්න. (ල.02)

   II. අනුරාධපුර කුට්ටම් පොකුණ ආශ්‍රිතව සොයා ගන්නා ලද සාධකය ලියා දක්වන්න. (ල.04)

   III. එකල භාරතීය ආභාෂය ලැබූ බවට තොරතුරු දක්වන සාධකයක් සිතුවම් ඇසුරින් ලියා දක්වන්න. (ල.06)

3. ශාන්තිකර්ම ඇසුරු කරගෙන පහතින් දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ශාන්ති කර්මය | පැවැත්වීමට හේතු | ප්‍රධාන වාද්‍යභාණ්ඩය | සැරසිලි | නාට්‍යමය අවස්ථා | ප්‍රධාන රංග වස්ත්‍රාභරණ |
|---|---|---|---|---|---|
| කොහොඹා කංකාරිය | 1. ......................... .......................... .......................... | 3....................... | 5. .................. | 7..................... 8....................... | 10...................... |
| දෙවොල් මඩුව | 2.......................... ............................ ........................... | 4........................ | 6........................ | 9...................... | 11...................... 12....................... |

(ල1×2)

4. I. භරත නාට්‍යවල මුලික සරඹ අභ්‍යාස දෙක නම් කරන්න. (ල.02)

   II. භරත නාට්‍ය සංදර්ශනයක් වර්තමාන තත්ත්වයට පත්කිරිම සඳහා දායක වූ ශිල්පීන්ගේ නම් ලියා දක්වන්න. (ල.04)

   III. භාරත නාට්‍ය ශිල්පිනයන් හිසට කරට හා කනට පළඳින ආභරණ දෙක බැගින් ලියන්න. (ල.06)

5. I. ගොප් ගෙඩිය නිර්මාණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණයක් ලියා දක්වන්න. (ල.02)

   II. ගොප් ගෙඩිය භාවිතයට ගන්නා අවස්ථා 04ක් නම් කරන්න. (ල.04)

   III. ගොප් ගෙඩිය නිර්මාණය කරන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.06)

6. පහත සඳහන් මාතෘකා තුලින් 3 ක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

   I. දළඳා පෙරහැරේ චාරිත්‍ර  II. කේ.එස්. ප්‍රනාන්දු මහතා

   III. නවරාත්‍රි උත්සවය  IV. සිරසපාද කවි

   V. එස් පණීභාරත මහතා (ල.04×3)